# බටහිරයන්ට විරුද්ධ ජාත්‍යන්තර සංවිධානයක්

දෙමළ ත්‍රස්තවාදය පරාජය කෙරී ඇති මුත් දෙමළ බෙදුම්වාදය හා ජාතිවාදය තවමත් ක්‍රියාත්මක වෙයි. දෙමළ ත්‍රස්තවාදය මෙන් ම දෙමළ බෙදුම්වාදය හා දෙමළ ජාතිවාදය ද පිටුපස ඇත්තේ බ්‍රිතාන්‍ය ප්‍රමුඛ බටහිර රටවල් ය. දෙමළ ජාතිවාදය යනු අන් කිසිවක් නොව මෙරට සිංගලත්වයට හිමි තැන අහිමිකිරීමට හැකිනම් සිංහලත්වය නැතිකිරීමට ලන්දේසින් විසින් ඇතිකරනු ලැබ බ්‍රිතාන්‍යන් විසින් පෝෂණයකරන ලද සංසිද්ධියකි. බ්‍රිතාන්‍යන් පළමුවෙන් ම කෙළේ ඉංගිරිසි උගත් දෙමළ ජනයාට මෙරට සෑම ක්ෂෙත්‍රයක ම ප්‍රධානත්වය දෙමින් ඔවුන් සිංහලයන්ට විරුද්ධව කරටුතු කරන්නන් පිරිසක් බවට පත්කිරීම ය. දහනවවැනි සියවසේ මුල් කාර්තුවේ ම ඉංගිරිසි උගත් දෙමළ ජනයා ඉංගිරිසි උගත් සිංහල ජනයාට වඩා උසස් කෙරිණි. එසේ උසස් කිරීමට නොහැකි තැන සමාන කෙරිණි. ව්‍යවස්ථාදායකයේ දෙමළ මන්ත්‍රී සංඛ්‍යාව සිංහල මන්ත්‍රී සංඛ්‍යාවට වඩා වැඩිකෙරුණේ හෝ සමානකෙරුණේ ඒ පදනමිනි. මේ සම්බන්ධ දීර්ඝ විස්තරයක් ප්‍රභාකරන් ඔහුගේ සියලා බාප්පලා හා මස්සිනාලා කෘතියෙහි සඳහන් වෙයි. පොන්නම්බලම් රාමනාදන් ඊනියා උගත් ලාංකිකයන්ගේ ප්‍රධානියා වීම, පොන්නම්බලම් අරුණාචලම් කොංග්‍රසය හැරගොස් දෙමළ මහජන සභාව පිහිටුවීම, ඊනියා පනහට පනහ ඉල්ලීම, දෙමළ නායකයන් සර්වජන ඡන්දය ප්‍රතික්ෂෙපකිරීම, සෝල්බරි කොමිසම හමුවට ගොස් දෙමළ මන්ත්‍රී සංඛ්‍යාව වැඩිකරන ලෙස ඉල්ලීම, චෙල්වනායගම් ලංකා දෙමළ රාජ්‍ය පක්ෂය පිහිටුවීම, ෆෙඩරල් රාජ්‍යයක් ඉල්ලීම, ඒ ඉල්ලීම වටා ඉංගිරිසි කතානොකරන දෙමළ ජනයා ද සිංහලයන්ට හා සිංහලත්වයට එරෙහිව සංවිධානයකිරීම, උතුරු හා නැගෙනහිර පළාත්වලට වෙන ම රාජ්‍යයක් ඉල්ලීම, ඒ ඉල්ලීම ඉටුකරගනු වස් දෙමළ තරුණයන් අතට ආයුධ දීම, ආයුධ ගත් ත්‍රස්තවාදය අවසානයේ දී පරාජය කරනු ලැබීම දෙමළ ජාතිවාදයෙහි ගමන් මග සනිටුහන් කරයි.

මේ සියල්ල පිටුපස බ්‍රිතාන්‍යන් සිටි බව මේ වන විට පැහැදිලි වෙයි. ත්‍රස්තවාදීන්ට ආයුධ සපයා දී ඇත්තේත් බ්‍රිතාන්‍යන් ප්‍රමුඛ බටහිරයන් බව පැහැදිලි ය. අද බ්‍රිතාන්‍යයේ සිටින දෙමළ ජනයා ලංකාණ්ඩුවට විරුද්ධව මෙහෙයවන්නේ ද බ්‍රිතාන්‍යය ය. එහි සිටින දෙමළ මැරයන්ට රිසිසේ ලංකාණ්ඩුවට විරුද්ධව උද්ඝෝෂණ, රැස්වීම්, පෙළපාළි, පිකට්ටු ආදිය පැවැත්විය හැකි ය. මුල දී එනම් දහනවවැනි සියවසේ දී හා විසිවැනි සියවසේ මුල්භාගයේ දී සිංහලත්වයට විරුද්ධව යොදාගැනුණේ ඉංගිරිසි උගත් දෙමළ ජනයා ය. සිංහලත්වයට එරෙහිව බ්‍රිතාන්‍යන් ගත් ක්‍රියාමාර්ග නිවැරදිකිරීමට 1956න් පසුව අතරින් පතර සිංහලයෝ උත්සාහ කළහ. සිංහල භාෂාව රාජ්‍ය භාෂාවකිරීම ඉන් එකකි. මෙරට අවුරුදු දහස් ගණනක් ඊනියා පාර්ලිමේන්තු පනතකින් නොවුවත් රාජ්‍ය භාෂාව වී තිබුණේ සිංහල ය. ඉංගිරිසිහු ඒ නැතිකර ඉංගිරිසිය රාජ්‍ය භාෂාව කළහ. 1956න් පසුව සිංහලය නැවත රාජ්‍ය භාෂාව බවට පත්කෙරිණි. එසේ කිරීමෙන් ප්‍රශ්නයක් වූයේ කාහට ද? ඉංගිරිසි නොදත් දෙමළ ජනයාට නම් නො වෙයි. ඔවුන්ගෙන් සුළු පිරිසක් වුව ද සිංහල දැන සිටින්නට ඇත. සිංහල රාජ්‍ය භාෂාව කිරීම එවැන්නන්ට කිසිසේත්ම අසාධාරණයක් නො වී ය. මෙහි අවාසියක් වී නම් ඒ සිංහල නොදැන ඉංගිරිසි දැනසිටි දෙමළ ජනයා ට ය. එහෙත් ඒ අසාධාරණයක් නොවන්නේ මෙරට ඓතිහාසිකව, සංස්කෘතික ව හා ජනගහණය ආදී වෙනත් කරුණු අනුව ද රාජ්‍ය භාෂාව විය යුත්තේ සිංහල මිස වෙනත් භාෂාවක් නොවන නිසා ය.

එහෙත් ඉංගිරිසි දැනසිටි දෙමළ නායකයන් වෙනුවෙන් සාමාන්‍ය දෙමළ ජනයා ද සිංහලත්වයට එරෙහිව සටනට කැඳවීමට චෙල්වනායගම් සමත් විය. දෙමළ ජාතිවාදය ලංකාවේ මෙන් ම ඉන්දියාවේ ද ක්‍රිස්තියානි කතෝලික සංස්කෘතික පදනමක විය. චෙල්වනායගම් දකුණු ඉන්දියානු ක්‍රිස්තියානි සභාවක සාමාජිකයෙක් විය. ඔහු ඒ සභාවේ පල්ලිවලට යෑම පුරුද්දක් කරගෙන සිටියේ ය. ඉංගිරිසි දත් ක්‍රිස්තියානි සංස්කෘතික පසුබිමක් ඇති ව සිටියවුන් බ්‍රිතාන්‍යන්ගේ අවශ්‍යතාව සඳහා සිංහලත්වයට එරෙහිව කළ සටනට ඉංගිරිසි නොදත් හින්දු දෙමළ ජනයා ද සහභාගි කරවීම චෙල්වනායහම්ගේ ජයග්‍රහණයක් විය. සිංහලය රාජ්‍ය භාෂාව කිරීමට විරුද්ධව ඉංගිරිසි නොදත් දෙමළ ජනයා ද සංවිධානය කළ චෙල්වනායහම් ඔහුගේ ව්‍යාජ සත්‍යග්‍රහ හා අවිහිංසාව ඔස්සේ ඒ දෙමළ ජනයා හිංසාව දෙසට තල්ලුකෙළේ ය. පොලිසීය හා සිංහල ජනයා ප්‍රකෝපකරමින් සිදුකළ මේ ව්‍යාජ අවිහිංසාවේ අවසාන ප්‍රතිඵලය වූයේ ප්‍රභාකරන් බිහිවීම ය. ප්‍රභාකරන්ගේ මිනීමැරුම්වලට චෙල්වනායගම් ද බටහිර ද වගකිවයුතු ය.

කෙසේ වෙතත් බ්‍රිතාන්‍යහු හා ඉංගිරිසි දත් දෙමළ ජනයා සිංහලත්වයට එරෙහි තම සටන ඉංගිරිසි නොදත් දෙමළ ජනයා ලවා කරවීමට සමත්වූහ. ඒ සටන සඳහා අවසානයේ දී තෝරාගනු ලැබූ නායකයා වූයේ ප්‍රභාකරන් ය. ඒ

© Prof. Nalin De Silva

සටනට ආයුධ සැපයුවෝ බ්‍රිතානීහු සෙසු බටහිරයෝ හා පිටරට වෙසෙන විසිරුණු දෙමළ ජනයා වෙති. අද ආයුධ ගත් සටනින් එනම් ත්‍රස්තවාදයෙන් දෙමළ ජාතිවාදීහු පැරදී සිටිති. එහෙත් දෙමළ ජාතිවාදය තම සටන අත්හැර නැත. ඒ සඳහා අද නැවතත් ඉංගිරිසි කතාකරන දෙමළ ජනයා සෘජුව සටනට එළඹෙති. ඔවුන් අද වඩාත් ම සිටින්නේ පිටරට බැවින් සටන අද මුහුදින් එතරට ගොස් ඇත. ඔවුන්ට එදා මෙන් ම අදත් බ්‍රිතානීන්ගේ හා සෙසු බටහිරයන්ගේ ආධාරය ලැබෙයි.  මේ සටනට එක් වී සිටි, ඇත්තට ම සටනෙහි කුලීකරුවන් වූ මාක්ස්වාදියෝ, ලිබරල්වාදියෝ, පශ්චාත්නූතනවාදියෝ, පශ්චාත්මාක්ස්වාදියෝ, රාජ්‍ය නොවන බැලයෝ, ඇතැම් පල්ලිවල පූජකයෝ ආදි මෙරට සිට ක්‍රියාත්මක වන සිංහල බෞද්ධ විරෝධීහු අද තම උපක්‍රම වෙනස්කර කළඑළියට පැමිණෙති. කොටින්ට විවිධාකාරයෙන් ආධාර කළ ඔවුහු තමන් කොටි විරෝධීන් වූ බව පවසති. ඒ අතර ඔවුහු ඊනියා දේශපාලන විසඳුමක් ගැන ද කතාකරති. අද අපට වඩාත්ම ප්‍රවේසම්වීමට සිදු වී ඇත්තේ කිසිම සමාජ පදනමක් නැතිවුවත්, සියළු දෙනාම එකතු වී ඡන්ද පනස්දාහක් මුළු ලංකාවෙන් ම ගත නොහැකි වුවත් ජඩමාධ්‍යයේ පිහිටෙන්, සමාජ තත්වයෙන් ඊනියා උගත්කමෙන් රැකියාවෙන් ආදී වශයෙන් සමාජ බලයක් අත්පත්කරගෙන සිටින මේ අතළොස්සෙනි. ඔවුන්ට අමතරව සටනින් පැරදී එහෙත් පරාජය පිළිගැනීමට අකමැති හා වෙනත් මාර්ග ඔස්සේ සිංලත්වයට එරෙහිව ක්‍රියාකරන බටහිරයෝ වෙති. අපට අද එකම මූලයක් ඇති මේ දෙකොටස ම පරාජයකිරීමට සිදුවී ඇත.

දහතුන්වැනි ව්‍යවස්ථා සංශෝධනය තවත් බලය බෙදීමෙන් පසුව, එනම් වර්ධිත දහතුන් වැනි සංශෝධනයක් ප්‍රශ්නයට විසඳුම ලෙස ක්‍රියාත්මක කරන ලෙස මේ දෙකොටස ම ඉල්ලති. අද විසඳීමට ප්‍රශ්නයක් නැත. බ්‍රිතානීන් ඇතිකළ ව්‍යාජ ප්‍රශ්නය විසඳීමට අවසානයේ දී දෙමළ ජාතිවාදීහු ආයුධ අතට ගත්හ. ඒ ප්‍රශ්නයට විසඳුම වූයේ හමුදා මෙහෙයුම් ය. අද ප්‍රශ්නය විසඳා ඇත. ඒ හමුදා විසඳුමක් බව සැබෑ ය. එහෙත් සෑම හමුදා විසඳුමක් ම දේශපාලන විසඳුමක් වෙයි. දැන් තවත් දේශපාලන විසඳුම් අවශ්‍ය නැත. ඡන්ද දහදාහක් ගැනීමට නොහැකි තිස්ස විතාරණ මහතාට ගෙදර යෑමට හැකි ය. බටහිරයෝ ඊනියා විසඳුමට අමතරව මෙරට සිටින ඔවුන්ගේ ගැත්තන්ගේ ආධාරය ද ඇතිව ඊනියා මානව අයිතිවාසිකම් හා යුද්ධ අපරාධ දඩමීමා කරගනිමින් ජනාධිපතිතුමා ආරක්ෂක ලේකම්තුමා හා හමුදාපතිවරුන් පෝරකයට යැවීමට උත්සාහ කරති. මේ උත්සාහය ලෝකයේ අනෙක් රටවල් නිසා දැනට පරාජය වී ඇත. අනෙක් රටවලට තේරුම් ගත හැකි දෙයක්, එනම් ලංකාව ත්‍රස්තවාදය පරාජය කර ඇති බවත් ලංකා හමුදාවෙන් ඊනියා යුද්ධ අපරාධ සිදු වී නොමැති බවත් බටහිරයන් තේරුම් නොගන්නේ එසේ තේරුම්ගැනීම බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට පරාජයක් වන බැවිනි. අද ආණ්ඩුව ගත යුතු ක්‍රියා මාර්ග දෙකක් වෙයි. මහින්ද රාජපක්ෂ මහතා අවුරුදු හත්සීයකට අටසීයකට පමණ පසු ජීවත්වූ රටේ ශක්තිමත් ම නායකයා බවට පමණක් නොව බටහිරයන්ට එරෙහිව සෙසු ලෝකය ම කරන සටනෙහි ද නායකයා බවට පත්ව සිටියි. බටහිරයන්ගේ බලපෑම් හමුවෙහි දණින් නොවැටී සිටීමට ක්‍රස්තෝගෙන් පසුව හැකි වූ නායකයා මහින්ද රාජපක්ෂ මහතා විය යුතු ය. ඒ මහතාට එතරම් ශක්තියක් වේ යැයි අපි ද නොසිතුවෙමු. ඒ මහතා අද ඒ තත්වයෙන් ප්‍රයෝජන ගත යුතු ය.

පනස්ගණන්වල බිහිවූ නොබැඳි රටවල සංවිධානය වැනි සංවිධානයක් බටහිර නොවන රටවල සාමාජිකත්වයෙන් ඇතිකිරීමට ඒ මහතාට හැකි යැයි සිතමු. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය අද යන ගී කියයි. මේ සියවස අවසන් වන විට එහි මළගම ද සිදුවනු ඇතැයි අපේක්ෂා කළ හැකි ය. අප අනාගතය සඳහා නව ලෝකයක් නිර්මාණය කළ යුතු ය. එහි නායකත්වය ලංකාවට ගත හැකි ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට එරෙහිව නව සුසමාදර්ශයක් නොව නව චින්තනයක් අවශ්‍ය ය. ඒ චින්තනය ඇත්තේ ලංකාවෙහි ය. ඒ අන්කිසිවක් නොව සිංහල ථෙරවාදී බෞද්ධ චින්තනය ය. බටහිර නොවන රටවල ලෝක සංවිධානය, එසේත් නැතහොත් ඊනියා ජාත්‍යන්තර ප්‍රජාවට එරෙහිව සැබෑ ජාත්‍යන්තර ප්‍රජාවගේ සංවිධානය ගොඩනැගීමේ එක් පියවරක් ලෙස කොටි සංවිධානය බටහිර බලවේගවල ආධාරයෙන් ද මනුෂ්‍යත්වයට එරෙහිව කර ඇති සියල්ල පිළිබඳ සොයා බලා වාර්තාකිරීමට බටහිර නොවන රටවල නියෝජිතයන්ගේ කොමිසමක් පත්කිරීම කාලෝචිත යැයි සිතමු. එහි දී බටහිර රටවල ක්‍රියාකාරිකම් ද සොයාබැලිය යුතු ය. බටහිරයන්ගේ ව්‍යාජ යුද්ධ අපරාධ චෝදනාවලට අප මුහුන දිය යුත්තේ ඔවුන් චූදිතයන් බවට පත්කිරීමෙනි. බටහිරය ක්‍රිස්තියානි නූතනත්වය තරම් මනුෂ්‍යත්වයට එරෙහිව ක්‍රියාකර ඇති සංස්කෘතියක් තවත් නැත. එහි මළගම ඉක්මන්කිරීමට හැකිනම් අප ඒ කළ යුතු ය. බටහිරයන් අප පෙළන්නේ ඔවුන් නිර්මාණය කර ඇති දැනුම උපයෝගී කරගනිමිනි. අප බටහිර දැනුමට විකල්ප වූ දැනුමක් බිහිකර ගත යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva